# මහනුවර නගරය මැද පිහිටි උඩවත්ත කැළය රක්ෂිතයේ ජෛව විවිධත්වය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය විමසා බැලීමේ දී මුල් අවධියේ දී ජනාවාස සහ රාජධානීන් ගොඩ නැගී ඇත්තේ වියළි කලාපීය තැනිතලා භූමි ප්‍රදේශයන්හිය. මෙම අවධියේ දී ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දක්වනු ලැබීය. එනම් රුහුණු, මායා සහ පිහිටි වශයෙනි. මේ අතුරෙන් මායා රට පිහිටියේ ජන ශූන්‍ය ප්‍රදේශයක් ලෙසිනි. මෙය කන්ද උඩරට ප්‍රදේශය ලෙස සැලකිය හැකිය.

කන්ද උඩරට එසේත් නොමැති නම් සෙන්කඩගල පුරවරයේ ආරම්භය ගැන විමසා බැලීමේ දී එය බු.ව. 655 වැනි ඈත අතීතයට දිව යයි. එනම් අනුරාධපුර රාජධානියේ ගජබා රජතුමා රාජ්‍ය කරන සමයේ දී එනම්, බු.ව. 655 දී සෙන්කඩ නැමැති තවුසෙක් මායා රට පිහිටි ගල් ගුහාවක භාවනා යෝගීව කල් ගතකර තිබේ. තම ආහාරය සඳහා වනාන්තරයේ පල වැල සොයා ඇවිද යන ඔහුට දිනක් සිවලෙකු විසින් හඹා යන සාවකු දක්නට ලැබී ඇත. මේ ලෙස බලා සිටින ඔහුට ඉතා විස්මිත සිදුවීමක් දක්නට ලැබුණි. එනම්, සිවලා විසින් හඹා ගිය හාවා එක් ස්ථානයක දී නැවත හැරී සිවලා හඹා යෑමට පටන් ගැනීමයි. එසේම නැවතත් තවත් දිනක දී, මෙම ස්ථානයේ දී ම ගැරඬියෙක් විසින් හඹා ගිය ගෙම්බෙක් ක්ෂණයෙන් අනෙක් පස හැරී ගැරඬියා පසුපස හඹා යනු මෙම තවුසාට දක්නට ලැබී තිබේ. මෙම සිදුවීම් නිසා මෙම ස්ථානය ජය භූමියක් ලෙස ඔහු විසින් තම සිත්හි සටහන් කර ගන්නා ලදී.

එක් දිනකදී, වනයේ අතරමං වූ මිනිසෙකු මෙම සෙන්කඩ තව්සාට මුණ ගැසී ඔහුට ඇප උපස්ථාන කිරීමෙන් පසු ඉහත සිද්ධීන් ඔහුට පවසා එම ස්ථානයේ ජනාවාසයක් ආරම්භ කරන ලෙස දන්වා සිටින ලදී. මෙහි ආරම්භ කළ ජනාවාසය සෙන්කඩ තවුසා විසූ ගල්ලෙන සමීපයේ වීම නිසා සෙන්කඩගල ග්‍රාමය ලෙස හැඳින්වී ය.

ඉන් පසුව, කුරුණෑගල රජකළ බුවනෙක බාහු රජතුමාගේ පුත් පණ්ඩිත පරාක්‍රම බාහු කුමරු බු.ව. 1846 දී කුරුණෑගල රජ වූ පසු මායා රට පිරිසක් තුටු - පඬුරු සහිතව රජතුමා බැහැ දැක සෙන්කඩගල ග්‍රාමය පිළිබඳ විස්තර ඔහු වෙත සැලකර එහි නගරයක් ඉදිකිරීමට සුදුසු බව දන්වා සිටින ලදී.

මෙම ආරාධනය පිළිගත් පණ්ඩිත පරාක්‍රම බාහු රජතුමා කුරුණෑගල පුරවරයේ විසූ විවිධ ශිල්පීන් රැස්කර එම පිරිසට අවශ්‍ය උපකරණ සහ ධනය සපයා රජතුමාගේ බෑනා කෙනෙකු වූ ඇමති සිරිවර්ධන සෙනෙවිරත්න සමග පිරිවර සෙන්කඩගලට යවා සෙන්කඩගල ග්‍රාමය මැදි කොට නගරයක් ඉදිකරන ලෙස දන්වන ලදී.

සෙන්කඩගලට පැමිණි සිරිවර්ධන ඇමති, රජතුමාගේ ඉල්ලීම පරිදි නගරය ඉදිකළ අතර පන්සලක් ඉදි කිරීමට සුදුසු තැනක් සෙවූ ඔහු නගරයට ආසන්නයේ තිබූ ජනාවාස නොවූ කඳු මුදුනක් ඒ සඳහා තෝරාගෙන භාවනායෝගී භික්ෂූන්ට වැඩ විසීමට සුදුසු ආරාමයක් සාදා නිම කරන ලදී. එම හේතුව නිසා මෙම ප්‍රදේශය ජනාවාස නොවී භාවනානුයෝගී භික්ෂූන් ගේ (ශ්‍රී රාජසිංහ රාජ සමයේ 1747-82) රාම  විහාරය ලෙස හඳුන්වනු ලැබීය.

දැනටමත් මෙම රාම විහාරය උඩවත්ත කැලය ආසන්නයේ එක් කෙලවරකට වන්නට දැකගත හැකිය. එසේම, සෙන්කඩගල රාජධානිය ආරම්භ වූ පසු රජ මාළිගය එසේත් නැතිනම් මහවාසල පිහිටා තිබුණේ උඩවත්ත කැළයට ඉතා ආසන්නවයි. අදත් පැරණි රජ මාළිගය සහ මගුල් මඩුව, ශ්‍රී දළදා මාළිගය සමීපයේ දක්නට ලැබේ. මහවාසලට ඉහළින් පිහිටා තිබූ මෙම වනය, මුල් කාලයේ දී ''උඩවාසල වත්ත'' යනුවෙන් හැඳින් වූ අතර පසු කාලයේ දී මෙය උඩවත්ත කැලය නම් විය.

මෙම වනාන්තරය තහංචි (තහනම්) කැලයක් ලෙස හැඳින් විය. තහංචි කැලෑවලට ඇතුල්වීම හෝ වෙනත් ක්‍රියාකාරකමක යෙදීම සාමාන්‍ය ජනතාවට සම්පූර්ණයෙන් ම තහනම් විය. ආරක්ෂක හා ආර්ථික හේතූන් මත මෙසේ තහංචි කැලෑ පවත්වාගෙන ගියා යැයි සැලකිය හැකි අතර මෙවැනි තහංචි කැලෑ, අලි - ඇතුන් බෝ කිරීම වැනි කාර්යයන් සඳහා ද යොදා ගනු ලැබිණි.

එසේම, ශ්‍රී ලංකාවේ රාජවංශය සලකා බැලීමේ දී අතීතයේ සිට ම රජතුමාගේ පරිහරණය සඳහා

වන උයන් පවත්වාගෙන ගිය බව සඳහන් වේ. උඩවත්ත කැලය ද ඒ අවධියේ දී රජතුමාගේ පරිහරණයට යොදා ගැනීමේ හේතුවෙන් තහංචි කැලයක් වූවා විය හැකිය. එසේම සතුරු ආක්‍රමණයන් සිදු වූ විට රජතුමාට සැඟ වී සිටීමට හැකි නිසා ද මෙම ප්‍රදේශය තහංචි කැලයක් ලෙස හැඳින්වූවා විය හැකිය.

තව ද, කන්ද උඩරට සංඝ පරම්පරාව සඳහා රජ දවස උඩවත්ත කැලය සහ හන්තාන ප්‍රදේශයේ වෙන්කර දුන් බිම් ද, තහංචි කැලෑ ලෙස එවකට සැලකිල්ලට ගනු ලැබීය. එසේම තහංචි කැලයක් ලෙස නම් කිරීම අගනරය ආසන්නයේ පිහිටියා වුව ද, මෙම ප්‍රදේශය විනාශ නොවීමට හේතුවන්නට ඇත. එම හේතුව නිසාවෙන් වර්තමානයේත් උඩවත්ත කැලෑ ප්‍රදේශය වනාන්තරයක් ලෙස දැක ගැනීමේ භාග්‍යය අපට හිමි වී තිබේ.

උඩවත්ත කැලය 1856 රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අතර 1938 දී වන සත්ත්ව අභය භූමියක් ලෙස රජය විසින් ප්‍රකාශයට පත්කර ඇත.

## උඩවත්ත කැලයේ පිහිටීම සහ ස්වභාවය

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ මුහුදු මට්ටමේ සිට අඩි 1,600-1,700 අතර ප්‍රමාණයේ පිහිටා ඇති නිවර්තන මැදරට සදාහරිත වනයක් (Tropical Mid Country Evergreen Forests) ලෙස උඩවත්ත කැලය හැඳින්විය හැකිය. හෙක්ටයාර 86.25 (අක්කර 207) පමණ භූමි ප්‍රමාණයකින් යුතු වූ මෙම වනය මහනුවර මහ නගර සීමාව තුළ ශ්‍රී දළදා මාළිගාව සමීපයෙහි පිහිටා තිබේ.

මෙම භූමි ප්‍රදේශය තුළ දැකිය හැකි පස් වර්ග නම් රතුවන් දුඹුරු මැටසෝල් පස (Reddish Brown Latosolic (RBL) අපරිනත දුඹුරු ලෝම පස Immature Brown Lome (IBL) සහ රතු කහ පොඩ්සෝල පස (Red Yellow Podzolic) යන කාණ්ඩයන්ය. මේ ප්‍රදේශයේ දේශගුණික තත්ත්වය නිවර්තන තෙත් මැදරට (Tropical Wet Mid-lands) ලෙස වර්ග කර දැක්විය හැකිය. උඩවත්ත කැලේ වන උද්‍යානය කෘෂි පාරිසරික විද්‍යාත්මක ප්‍රදේශ $WM_3$ (Agm - ecological) හි පිහිටා ඇත. මෙම ප්‍රදේශයේ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මි.මී. 2500 සිට මි.මී. 3000 ක් පමණ වන අතර වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 22-27 පමණ වේ.

## උඩවත්ත කැලය තුළ දැකිය හැකි ස්මාරක හා විශේෂ ස්ථාන

### 1. සෙන්කඩ ලෙන

මෙය උඩවත්ත කැලයේ පැරණි මාලිගයට පිටුපසට වන්නට පිහිටා ඇත. අතීතයේ විසූ සෙන්කඩ නැමැති තවුසා වාසය කළ ස්ථානය ලෙස විශ්වාස කෙරේ.

### 2. කොඩිමලේ

මෙම ස්ථානය උඩවත්ත කැලය තුළ ඇති කඳු ගැට කිහිපය අතරින් උසම ස්ථානය වේ. පැරණි රජ සමයේ දී මෙම ස්ථානයේ ජාතික සහ ආගමික කොඩි යවිකර තිබූ ස්ථානයක් ලෙස පිළි ගැනේ.

### 3. කිරිගරුඬ ආසනය

මෙය උඩවත්ත කැලය තුළ තිබූ පැතලි කිරිගරුඬ පාෂාණයකි. පැරණි මාර්ග සිතියම්වල "Marble seat path" යනුවෙන් හැඳින්වෙන මාර්ගය මඟින් මෙයට ළඟා විය හැකි වුවත් වර්තමානයේ මෙම මාර්ගය වැසී ගොස් ඇත. දැනට මෙම ආසනය මෙම ස්ථානයේ දක්නට නොමැත.

### 4. යුද ස්මාරකය

සිංහලයන් සමඟ පැවති යුද්ධයේ දී මිය ගිය සොල්දාදුවන්ගේ සිරුරු මිහිදන් කර ඇති සොහොන් බිමෙකි. මෙම සොහොන් බිමෙහි සොහොන් කොත් 163 ක් තිබූ බවට සාක්ෂි හමු වේ.

## උඩවත්ත කැලය තුළ වූ බෞද්ධ මධ්‍යස්ථාන

අතීතයේ දී උඩවත්ත කැලය වනයට අයත් භූමි භාගය තුළ රාම විහාරය, ගංගාරාමය, කීර්ති ශ්‍රී පොත්ගුල් විහාරය, සිරිවර්ධනාරාමය, ශ්‍රී දළදා තපෝවනය දක්නට ලැබී ඇත. දැනට මෙම විහාර උඩවත්ත කැලය මායිමට ආසන්නව දක්නට ලැබේ. අදටත් සේනානායක ආරාමය, ජර්මන් විහාරය, මෛත්‍රී කුටිය වැනි ස්ථාන උඩවත්ත කැලේ වන උද්‍යානය තුළ ම දක්නට ලැබේ. සෙන්කඩගල නගරය ආරම්භයත් සමගම මෙම වනය ආශ්‍රිතව බෞද්ධ මධ්‍යස්ථාන බිහි වූ බව වාර්තා වේ. මෙනිසා උඩවත්ත කැලයේ යම්කිසි ආගමික හා සංස්කෘතික වටිනාකමක් ද ගැබ් වී තිබෙන්නේ යැයි සඳහන් කළ හැකිය. මෙය උඩවත්ත කැලයට

වගුව 01.

**උඩවත්ත කැලයේ නැවත වන වගා සිදු කර ඇති වර්ෂ සහ ඒ සඳහා භාවිතා කර ඇති ශාක විශේෂ සහ බිම් කට්ටි**

| බිම් කට්ටි | ප්‍රමාණය (හෙක්ට) | වගා කරන ලද වර්ෂය | වගා කරන ලද ශාක විශේෂ |
|---|---|---|---|
| 1A | 2.92 | 1928 | හවරිනුග, ගිනි සපු, පිහිඹිය, නා |
| 2A | 4.58 | 1926 | ගිනිසපු,කොස්,පිහිඹිය |
| 2B | 2.08 | 1929 | හවරිනුග, ගිනිසපු, පිහිඹිය |
| 5A | 2.92 | 1927 | ගිනිසපු, පිහිඹිය |
| 5B | 1.67 | 1929 | හවරිනුග, ගිනිසපු, පිහිඹිය |
| 5C | 1.25 | 1933 | හවරිනුග, ගිනිසපු, මහෝගනී, නා |
| 6B | 3.75 | 1922 | ගිනිසපු, කොස්, පිහිඹිය |

පමණක් සීමා වූ විශේෂ ලක්ෂණයක් නොවේ. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල තිබෙන වෙනත් වනාන්තර තුළ ද විශේෂ ආගමික සහ සංස්කෘතික වටිනාකම් තිබෙනු අපට බොහෝ විට දක්නට ලැබේ. මහා වංශයේ සඳහන් වන පරිදි අනුරාධපුරය මහා විහාරය අසල චිංයාරාමය නමින් වන උද්‍යානයක් පැවති ඇත. එසේම, ශ්‍රී ලංකාවට බෞද්ධාගම පැමිණීමත් සමග ම මුටසීව රජතුමන් විසින් මහා මේඝ වනය නම් උද්‍යානයක් කරවූ බව ද මහා වංශයේ සඳහන් වේ. මෙවැනි වනාන්තරවල සංස්කෘතික සහ ආගමික වටිනාකමක් ගැබ් වී තිබීම ශ්‍රී ලංකාවේ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකිය.

## උඩවත්ත කැලය මධ්‍යයේ වූ ජලාශය

මහනුවර රජ සමයේ මෙම ප්‍රදේශය තහනම් කැළයක් වූ අතර රජ බිසව ඇතුළු රජ පවුලේ සාමාජිකයින් මෙම ජලාශයේ දිය කෙලියෙහි යෙදීමට භාවිතා කර ඇති බව සඳහන් වේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ වස්තුව සහිත රන් සෙම්බුවක් මෙම ජලාශයේ ඇති බවත්, වර්ෂයේ එක් දිනක දී මෙය ජලයෙන් උඩට මතු වී නැවත යට යන බවටත් ජනප්‍රවාදයේ සඳහන් වේ. එසේම නුවර වැව මැද පිහිටි දූපතේ සිට මෙම ජලාශයට උමගක් තිබූ බවට ද විශ්වාසයක් ජනප්‍රවාදයේ පවතී. අදත් වසරේ සෑම කාලයක දී ම මෙම ජලාශය හොඳින් ජලය පිරී තිබෙනු දැක ගත හැකිය.

## උඩවත්ත කැලයේ දැකිය හැකි ශාක විශේෂ

උඩවත්ත කැලයේ විවිධ බිම් කට්ටි විටින් විට වගා කර වැඩි දියුණු කර ඇති නිසා අද මෙහි දැකිය හැක්කේ සම්පූර්ණ ස්වාභාවික වනාන්තරයක් නොවේ. මෙම වනයේ බිම් කට්ටි 07 ක් තුළ නැවත වගා කිරීම සිදු කර ඇත.

අංක 1 වගුවෙහි ඇති ශාක විශේෂවල උද්භිද විද්‍යා නාමයන් පහතින් ඇති ශාක විශේෂ ලැයිස්තුවේ සඳහන් වේ.

උඩවත්ත කැලයේ ශාක සඳහා අධ්‍යයනය කිරීමේ දී ඒවා ශාක වියන් තුනකට බෙදී තිබෙනු දක්නට ලැබේ. මෙය ප්‍රමුඛ ශාක වියන, ද්විතියික ශාක වියන හා යටි ස්ථරය ලෙස බෙදා දැක්විය හැකිය. මීට අමතරව විවිධ ආරෝහක ශාක ද මෙම වනය තුළ දැකිය හැකිවේ.

මෙම වනාන්තරයේ ප්‍රමුඛ ශාක වියනේ දැකිය හැකි ශාක විශේෂ නම් තෙල් කැකුණ, මොර, නුග ඇද්දෙමට, මී, ඇටඹ, නා, ඉඹුල්, මැහෝගනී, කොස්, සපු, පිහිඹිය, වල්දෙල්, දූරියන් සහ කිතුල් වැනි ශාක විශේෂයන්ය. එසේම මෙහි ද්විතියික ශාක වියනේ දවට, කහට, නා, මිල්ල, බදුල්ල, නාවා, මඩිතිය, බටදොඹ සහ මලබඩ වැනි ශාක විශේෂ දක්නට ලැබේ.

මෙම වනාන්තරයේ යටි ස්ථරයේ කුරුඳු, මාවේවැල්, නාවා වැනි ශාක විශේෂ දක්නට ලැබේ. මීට අමතරව ආරෝහක ශාක වශයෙන් පුස්වැල්, වල්

ගම්මිරිස් සහ නාපිරිත්ත වැනි වැල් වර්ග ද දක්නට ලැබේ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය බාලසුබ්‍රමනියම් මහතා විසින් සකස් කළ ලැයිස්තුවකට අනුව උඩවත්ත කැලය තුළ පර්නාංග සහ සපුෂ්ප ශාක විශේෂ 401 ක් පමණ හඳුනාගෙන ඇති අතර මෙයින් විශේෂ 09 ක් ශ්‍රී ලංකාවට ආවේනික ශාක විශේෂ වේ. එම ආවේනික ශාක විශේෂ සහ බහුල වශයෙන් උඩවත්ත කැලයේ දක්නට ලැබෙන ශාක විශේෂ ලැයිස්තුවක් මෙහි පහත දක්වා ඇත.

### උඩවත්ත කැලයේ බහුලව දක්නට ලැබෙන ශාක විශේෂ

| ශාක විශේෂය | | උද්භිද විද්‍යා නාමය |
|---|---|---|
| * අන්කෙන්ද | - | Acronychia |
| * මදටිය | - | Adenathera pavonine |
| * තෙල් කැකුණ | - | Aleurites moluccans |
| * කරවල කැබැල්ල | - | Antidesma bunius |
| * කොස් | - | Artocarpus heteropyllus |
| * වල්දෙල් | - | Artocarpus nobils |
| * උණ | - | Bambusa spp |
| * මාවේවැල් | - | Calamus thwaitesii |
| * වන සපු | - | Canangium oboratum |
| * දවට | - | Carallia brachiata |
| * කහට | - | Careya arborea |
| * කිතුල් | - | Caryota urens |
| * කුරුඳු | - | Cinnamomum verum |
| * දූරියන් | - | Durio zibethinaus |
| * මොර | - | Democarpus longana |
| * නුග | - | Ficus ferigusonii |
| * පිහිඹියා | - | Filicium decipeins |
| * නියඟලා | - | Gloriosa superba |
| * ඇත්දෙමට | - | Gmelina arborea |
| * වල්ලා | - | Gyrinops walla |
| * මී | - | Madhuca longifolia |
| * ඇටඹ | - | Mangifera zeylanica |
| * නා | - | Mesua ferrea |
| * සපු | - | Michelia champaca |
| * මලබොඩ | - | Myristica dactyloides |
| * වල් ගම්මිරිස් | - | Piper sylvestre |
| * නා ඉඹුල් | - | Pometia exima |
| * කටු ඉඹුල් | - | Salmalia celba |
| * බදුල්ල | - | Semecarpus |
| * නාවා | - | Setrculia balaghas |
| * මැහෝගනී | - | Swietenia macrophyiia |
| * බටදොඹ | - | Syzygium gardneri |
| * මිල්ල | - | Vitex altissima |
| * හවරිනුග | - | Alstonia macrophylla |
| * ගිනිසපු | - | Michelia champaca |

### වන උයන තුල දක්නට ලැබෙන ඒක දේශීය ශාක

| | | |
|---|---|---|
| * උඩවැඩියා විශේෂයකි | - | Tropidia thwaitesii |
| * දුනුකෙයියා | - | Gyrinops thwaitesii |
| * වල්ල | - | Gyrinops walla |
| * කලු කැර | - | Goniothalmus gardener |
| * පුස්වැල් | - | Dracaena thwaitesii |
| * වැදිකෝක ගහ | - | Dracaena thwaitesii |
| * මාවේවැල් | - | Calamus thwaitesii |
| * ගොඩ මිදෙල්ල | - | Barringtonia zeylanica |
| * වල්දෙල් | - | Artocarpus nobilis |

### උඩවත්ත කැලයේ දැකිය හැකි ක්ෂීරපායි සතුන්

අතීතයේ දී මෙම වනාන්තරය තුළ අලි ඇතුන් සහ ගෝනුන් වැනි විශාල සතුන් සිටි බව සඳහන් වේ. වර්තමානය වන විට එම සතුන් දැක ගත නොහැක. දැනට උඩවත්ත කැලයේ දැකිය හැකි ක්ෂීරපායින් නම් රිළවා, ඉත්තෑවා, මීමින්නා, හාවා, ලේනා සහ කොළ දිවියා වැනි සතුන් වේ. මෙයින් රිළා (Macaca Sinica) විශේෂය ශ්‍රී ලංකාවට අවේනික සත්ත්ව විශේෂයකි. මීට අමතරව මුගටීන්, කලවැද්දන් වැනි සතුන් ද මෙම වනය තුළ ජීවත් වේ.

### උඩවත්ත කැලයේ දැකිය හැකි පක්ෂීන්

උඩවත්ත කැලයේ වන උද්‍යානය තුළ කුරුළු විශේෂ 75 ක් පමණ දැනට වාර්තා වී ඇත. වැඩිදුර අධ්‍යයනයකදී මීට වඩා කුරුලු විශේෂ සංඛ්‍යාවක් දැක ගැනීමට හැකියාව ලැබෙනු ඇත. උඩවත්ත කැලයේ වන උද්‍යානය තුළ දැනට වාර්තා වී ඇති කුරුලු විශේෂ ගණනාවක් පහත දක්වා ඇත.

| පක්ෂි විශේෂය | | සත්ත්ව විද්‍යාත්මක නාමය |
|---|---|---|
| * හිස කළු පුංචි දෙමලිච්චා | - | Ceylon black - fronted Babbler |
| * දුඹුරු දෙමලිච්චා | - | Ceylon brown -capped Babbler |
| * දෙමලිච්චා | - | Ceylon white - headed Babbler |

* දුඹුරු දෙකැටි දෙමලිච්චා - Southern Ceylon scimitar-babbler
* පොලොස් කොට්ටෝරුවා - Brown headed barbet
* කඳුකර කොට්ටෝරුවා - Yellow - fronted barbet
* හීන් කොට්ටෝරුවා - Small Ceylon barber
* මල් කොට්ටෝරුවා - Crimson -breasted barbet
* කෙටි පැදැති කුරුමිණි කුරුල්ලා - Chestnut - headed bee-eater
* මහ කුරුමිණි කුරුල්ලා - Blue-tailed bee-eater
* කළු කොන්ඩයා - Ceylon white - browed bul bel
* හිස කළු කහ කොන්ඩයා - Black headed yellow bul bel
* කොන්ඩයා - Red-vented bul bel
* ගළු ගඩු කොන්ඩයා - Ceylon white-browed bul bul
* ඉන්දියානු කහ කොන්ඩයා - Indian yellow browed bul bul
* ගිරා කුරුල්ලා - Gold fronted chloropsisa
* ජෝර්දන්ගේ ගිරා කුරුල්ලා - Jerdon's chloropis
* ඇටි කුකුළා - Souther coneal
* කොළඹ කාක්කා - Grey-necked crow
* කාක්කා - Black crow
* අළු කොබෙයියා - Ceylon spotted dove
* නීල කොබෙයියා - Ceylon bronze - winged dove
* කවුඩා - Dark white-bellied drongo
* බඩ සුදු කවුඩා - Common Ceylon drongo
* කොන්ඩ රාජාලියා - Crested hawk-eagle
* මුහුදු රාජාලියා - White-bellied sea-eagle
* සර්ප රාජාලියා - Ceylon small flowerpecker
* පිලල් ගෙඩි සුටික්කා - Ceylon black napped flycatcher
* නිල් කුරුල්ලා - Ceylon black napped flycatcher
* කොපි කුරුල්ලා - Ceylon orange-breasted blue flycatcher
* සුදු රෙදි හොරා - Indian paradise - flycatcher
* සිවුරු හොරා - Ceylon paradise-flycatcher
* සැළලිහිණියා - Hill mynah
* බඩ කළු පනු කුරල්ලා - Ceylon lora
* කොබෙයි උකුස්සා - Black winged kite
* බ්‍රාහ්මණ උකුස්සා - Brahminy kite
* රංග පිළිහුඩුවා - Three-foed kingfisher
* මල් පිළිහුඩුවා - Ceylon common kingfisher
* පිළිහුඩුවා - Indian white breasted king fisher
* කොහා - Indian koel
* ගිරා මලිච්චා - Ceylon lorikeet
* හීන් ගිනි කුරුල්ලා - Ceylon little minivet
* ගිනි කුරුල්ලා - Orange minivet
* කඳුකර වී කුරුල්ලා - Ceylon hill munia
* පුල්ලි වී කුරුල්ලා - Spotted munia
* මයිනා - Common ceylon mynah
* නිල් පනු කුරුල්ලා - Welver fronted nurhatch
* කහ කුරුල්ල - Ceylon black headed oriole
* වන බකමූණා - Indian brown wood owl
* නීල කොබෙයියා - Green winged done
* අවිච්චියා - Indian pitta
* පොලකිච්චා - Southern magpie robin
* කළු පොලකිච්චා - Ceylon black robin
* වල් පොලකිච්චා - Ceylon shama
* කුරුළු ගොයා - Ceylon shikar
* ගේ කුරුල්ලා - Ceylon house-sparrow
* මල් සුටික්කා - Ceylon purple rumped sunbird
* ලෝටන්ගේ රංග සුටික්කා - Loten's sun bird
* දම් සුටික්කා - Purple sun bird
* යුරෝපීය වැහිලිහිණියා - Common swallow
* වැහිලිහිණියා - Ceylon striated swallow
* කොන්ඩ වැහිලිහිණියා - Indian palm swift
* පුංචි වැහිලිහිණියා - Indian palm swift
* බට්ටිච්චා - Common Ceylon tailor bird
* අළු පනු කුරුල්ලා - Ceylon grey tit
* අළු හැලන්පෙන්දා - Grey wagtail
* ලා කොළ හඹු කුරුල්ලා - Greenish leaf-warbler
* ප්‍රැන්ක්ලින්ගේ හඹු කුරුල්ලා- Franklin's prinia
* කොරවක්කා - White breasted waterhen
* හීන් මල් කුරුල්ලා - Small white eye
* කොන්ඩේ කහ කැරලා - Ceylon yellow naped green woodpecker
* පිට රතු කැරලා - Ceylon red backed wood pecker
* මුටි කැරලා - Ceylon pigmy woodpecker
* මුකලන් කැරලා - Layard's woodpecker

පක්ෂීන් විශාල ප්‍රමාණයක් උඩවත්ත කැලය භූමියේ දී අපට දැක ගත හැකිය. උඩවත්ත කැලයේ පක්ෂීන් නැරඹීම සඳහා හොඳම කාලය උදෑසන 6.15 සිට 8.30 දක්වාත් සවස 4.30 සිට 5.30 දක්වාත් ලෙස වාර්තා වේ. උඩවත්ත කැලයේ පිහිටි ජලාශය අසල දී ජලජ පක්ෂීන් මෙන් ම මුහුදු රාජාලියා ද දැකිය හැකි වේ.

මෙයට අමතරව උරගයින්, සමනල් වර්ග සහ වෙනත් කෘමි වර්ග ගණනාවක් වෙසෙයි. තව ද, උරග වර්ග බොහෝ සංඛ්‍යාවක් අතර මෙහි වෙසෙන ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්වයෙකු වන කරමල් බෝදිලිමා (Hump nosed lizard) නැමැති කටුසු විශේෂය උඩවත්ත කැලයෙන් වාර්තා වී ඇත.

### උඩවත්ත කැලයට සංචාරකයින්ගේ පැමිණීම

දැනටමත් බොහෝ විට පාසල් සිසුන් ඔවුන්ගේ අධ්‍යාපනික කාර්යයන් සඳහා ද, පර්යේෂකයින් පර්යේෂණ කාර්යයන් සඳහා ද කුරුල්ලන් නරඹන්නන් ඒ සඳහා ද, එසේම විනෝද සුවය විඳීමට එන ජනයා මෙන්ම බෞද්ධ ආරාමවලට පැමිණෙන පිරිස ද ආදී වශයෙන් බොහෝ දේශීය හා විදේශීය සංචාරකයින් පිරිසක් මෙම වනයට වාර්ෂිකව පැමිණේ.

සොයා ගැනුන හා වෙනත් ලැබූ දත්ත වලට අනුව 2003, 2004, 2005 සහ 2006 වර්ෂවල මෙම වන උද්‍යානයට පැමිණි දේශීය හා විදේශීය සංචාරකයින් රැසකි.

මෙම තොරතුරුවලට අනුව පැමිණෙන සංචාරකයින් ගෙන් 72% ප්‍රමාණයක් දේශීය සංචාරකයින් වන අතර 28% ප්‍රමාණයක් විදේශීය සංචාරකයින් වේ.

උඩවත්ත කැලයට සුවිශේෂ වූ පිහිටීම නිසා මෙම ස්ථානය පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා හොඳින් යොදා ගත හැකි ස්ථානයක් වේ. විශේෂයෙන් මහනුවර නගරය සහ අවට ඇති ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථාන නැරඹීමට එන දේශීය හා විදේශීය සංචාරකයින් උඩවත්ත කැලය නැරඹීම සඳහා ගෙන්වා ගනීම ඉතාමත් පහසුවෙන් කළ හැකි වේ.

පවතින පාරිසරික තත්ත්වයන් සහ පර්යේෂණ කටයුතු සඳහා ඇති ඉඩකඩ තබා ගනිමින් ම මෙම උද්‍යානය පරිසර සංචාරක ව්‍යාපාරයටත් සාර්ථකව යොදා ගන්නේ නම් පහත වැඩි දියුණු කිරීම් කළ යුතු වේ. උද්‍යානය තුල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කිරීමට යන සංරක්ෂණ මධ්‍යස්ථානය උද්‍යානයට පැමිණෙන්නන් සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක විය යුතුය. එමගින් උද්‍යානයේ ඓතිහාසික වටිනාකම, විද්‍යාත්මක වටිනාකම වැනි කරුණු පිළිබඳ අමුත්තන් දැනුවත් කළ හැකිය.

### පවතින වනය තුළ සිදුකළ යුතු වැඩි දියුණු කිරීම්

වනයේ මැහෝගනී ශාක ඇති ස්ථානවල එම ශාක විශේෂයම ප්‍රති ව්‍යාප්තිය හේතුවෙන් ස්වාභාවික ශාක විශේෂ වැඩීම පාලනය වී මැහෝගනී ශාක පමණක් ඇති ඒකීය වගාවක ස්වාභාවයක් හටගෙන තිබේ. මේ නිසා, ස්වාභාවික පරිසර පද්ධතියට හානි සිදු විය හැකි අතර එමඟින් ස්වාභාවික පරිසරයේ ඇති සුන්දරත්වයට ද හානි සිදු කරයි. මේ හේතුව නිසා මෙවැනි බිම් ප්‍රදේශවල වනය තුල ඇති අවේනික ශාක විශේෂ නැවත හඳුන්වා දීම සිදු කළ යුතුය.

මේ සඳහා වල්දෙල් (Garcinia Artocarpus), කිතුල් (Karyota Plam), කැකුණ (Aleurites Moluccans), බටදොඹ (Syzigium), මොර (Democarpus), කහට (Careya arborea) සහ වේවැල් (Calamus thwaitesii) වැනි ශාක විශේෂ යොදාගත හැකි වේ. අධික ලෙස ප්‍රතිව්‍යාප්ත වී ඇති මැහෝගනී පැළ මීටරයක් පමණ පළලට පේළි වශයෙන් කපා ඉවත් කර මෙම ශාක හඳුන්වා දිය හැකිය. එසේම, වනයේ තැනින් තැන ඇති හිස් තැන් උණ පඳුරු සහ වේවැල් වැනි ආවේනික ශාක විශේෂ හඳුන්වා දී පුරවා දැමිය යුතු වේ.

මෙවැනි ක්‍රමයක් සිංහරාජ වනය ආශ්‍රිතව තිබෙන පයිනස් වගාවන් තුළ ආරම්භ කර සාර්ථක ප්‍රතිඵල ලබා ඇත.

වනයේ මායිම්වලට වන්නට වියන් ස්ථරයේ විශාල වශයෙන් හිඩැස් දක්නට ලැබේ. සංචාරකයන්ගේ ප්‍රධාන මාර්ග වැටී ඇත්තේත් මෙම මායිම් වලට ආසන්නයෙනි. මේ නිසා, මෙම මාර්ගවල ඇවිද යන සංචාරක අමුත්තන්ට වියන් හිඩැස් තුළින් නාගරික ජනාවාස ප්‍රදේශ දර්ශනය වීම එතරම් සුන්දර දසුනක් නොවේ. "ලේඩි හෝර්ටන්" මාවතේ ඇවිද යන විට මෙම අත්දැකීම් ලබාගත හැකිය. මෙය වලක්වා ගැනීම සඳහා වන උද්‍යානයේ මායිම්වලට වන්නට ශීඝ්‍රයෙන් වැඩෙන විශාල ශාක වර්ග සහ වැල් වර්ග ව්‍යාප්ත කිරීම වැදගත් වේ.

### උඩවත්ත වන උද්‍යානය තුළ පිහිටි ජලාශයේ කළ යුතු වැඩි දියුණු කිරීම්

දැනට මෙම ජලාශය එතරම් සැලකිල්ලට ගෙන ඇති බවක් නොපෙනේ. වන උද්‍යානය තුළ විශේෂ ස්ථානයක් වන මෙය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම සුදුසුය. වසර පුරාම ජලයෙන් පිරී පවතින මෙම ජලාශයේ ජලයේ තත්ත්වය එතරම් හොඳ නැති බව පෙනී යයි. ඇල්ගී ජලජ ශාක වැඩීම හේතුවෙන් ජලය කොළ පැහැයට හැරී ඇත. එසේම දිරා යන ලී කොට වැනි දේ ජලාශය තුළ දැකිය හැකි අතර ඒවා ඉවත් කර ක්‍රමානුකූලව පිරිසිදු

කිරීමට කටයුතු කළ යුතු වේ. තව ද, ජලජ පැළෑටි වර්ග මෙම ජලාශයට හඳුන්වා දිය හැකි අතර ජලාශයේ ඉවුරේ උණ ගස්, විවිධ පන් වර්ග වගා කිරීම මඟින් පස සෝදා ගෙන යාම වැළැක්විය හැකි අතර එය අවට අලංකාරයට ද හේතු වේ. උදෑසන සහ සවස් වරුවේ දී මෙම ස්ථානය කුරුල්ලන් නැරඹීම සඳහා සුදුසු ස්ථානයකි.

## වන උද්‍යානයට අලුතින් හඳුන්වා දිය හැකි අංග

### 5.1 ඖෂධ පැළෑටි සහිත භූමියක් හඳුන්වාදීම

වන ඖෂධ පැළෑටි සහිත භූමි භාගයක් හඳුන්වා දිය හැකිය. අධ්‍යාපනික හා පර්යේෂණ අගය වැඩි කිරීමටත්, නරඹන්නන් දැනුවත් කිරීමටත්, උඩවත්ත කැළයේ සහ මැදරට ස්වාභාවික වනාන්නතරවල දක්නට ලැබෙන විවිධ වන ඖෂධ ශාක වර්ගවල එකතුවක් මෙම උද්‍යානය තුළ ආරම්භ කළ හැකිය. මේ සඳහා වන උද්‍යානයේ නැවත වගා කර ඇති භූමියකින් කොටසක් භාවිතා කළ හැකිය. එසේ කළහොත් වනයේ ස්වාභාවික තත්ත්වයට හානියක් සිදු නොවේ. මෙවැනි ස්ථානයක් උද්‍යානය නැරඹීමට එන පාසල් සිසුන්ට සහ එම විෂය ගැන උනන්දුවක් දක්වන පිරිසට ඉතා වැදගත් විය හැකිය. මෙහි සියළු ශාක වර්ග නාමකරණය කර එහි ප්‍රයෝජන ගැනීම ද සඳහන් කර තබන්නේ නම් වැදගත්කම ඉතා වැඩි වේ.

### 5.2 කඳවුරු භූමියක් හඳුන්වා දීම

වන උද්‍යානයේ නවාතැන් ගැනීමට අදහස් කරන අමුත්තන් සඳහා කඳවුරු භූමියක් උද්‍යානය තුළ ඇති කිරීම කාලෝචිත වේ. මේ සඳහා ප්‍රධාන මාර්ග වලින් බැහැර ස්ථානයක් තෝරා ගත යුතු අතර ලී දඬු භාවිතා කර සාදනු ලැබූ ගොඩනැගිල්ලක් (wood cabin) මේ සඳහා සුදුසු අතර නල ජලය සහ වැසිකිළි පහසුකම් ද සැපයිය යුතු වේ. මේ සඳහා කඳවුරු ඇඳන්, ලන්තෑරුම් හා ගෑස් භාවිතා කර ආහාර පිසීමේ පහසුකම් ද සැපයීම වැදගත් වේ. දේශීය සංචාරකයින්ට හා විදේශීය සංචාරකයින්ට මෙහි පහසුකම් සැලසීම සිදු කළ හැකි අතර කඳවුරු බිම වෙන්කර ගැනීම උඩවත්ත කැළයේ කාර්යාලයෙන් හෝ කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් සිදුකර ගත හැකි ලෙසට සැලසුම් කිරීම ඉතා වැදගත් වේ.

### 5.3 නාම පුවරු සහ මාර්ග සංඥා සකස් කිරීම

වන උද්‍යානය තුළ මාර්ග හඳුනා ගැනීම සඳහා නාම පුවරු සකස් කිරීම ඉතා වැදගත් වේ. ඒ සමගම තමන් ගමන් කරන මාර්ගය හඳුනා ගැනීම සඳහා සටහන් තැබීම ද වැදගත්ය. ඒ සඳහා මාර්ග සිතියමේ ඒ ඒ මාර්ගය සඳහා විවිධ වර්ණ හඳුන්වා දී මාර්ගය අතරමග එම වර්ණයෙන් ඊතල සලකුණු සහ මාර්ගයෙන් ගමන් කරන දිශාව දක්වන පුවරු ගමන් මාර්ගය දෙපස සවිකිරීම වැදගත් ය. වනයේ ඇති සුවිශේෂ ස්ථාන, කුරුල්ලන් නැරඹිය හැකි ස්ථාන වැනි දේවල් සඳහා ද නාම පුවරු සකස් කර ප්‍රදර්ශනය කිරීම නරඹන්නන් හට පහසුවක් වේ.

### 5.4 මාර්ග සහ වනය තුළ නඩත්තු කටයුතු

වන උද්‍යානය තුළට දැනටත් වාහන ඇතුල් කිරීමට නොදීම ඉතාමත් වැදගත් පියවරකි. මෙහි දී, අමුත්තන් සඳහා ඇවිද යාමට ඇති මාර්ගවල තත්ත්වය මනා ලෙස නඩත්තු කිරීම මඟින් උද්‍යානයේ පැවැත්ම වඩා වැඩි දියුණු කළ හැකි වේ. පැරණි කාලයේ සඳහන් වූ සමහර මාර්ග අද වන විට සම්පූර්ණයෙන් ම භාවිතයට ගත නොහැකි ආකාරයට වල් බිහි වී ඇත. මේ සම්බන්ධ සිතියමක් නිරීක්ෂණයෙන් කොපමණ මාර්ග ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත නොහැකි ආකාරයට වල් බිහි වී ඇත්දැයි සංචාරකයන්ට අවබෝධ කරගත හැකි වේ. මාර්ග නඩත්තුව සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ හෝ කම්කරුවන් යොදා ගෙන පැරණි මාර්ග සියල්ලම පාගේ භාවිතයට ගත හැකි ආකාරයට නැවත සකස් කිරීම මඟින් උද්‍යානයට නව මුහුණුවරක් දිය හැකි වේ. ''කිරිගරුඬ ආසනය'' නැමැති ස්ථානය අද සොයා ගැනීමටත් නොහැකි ආකාරයකට එකල තිබූ මාර්ගය වල් බිහි වී ගොසිනි. මෙවැනි ස්ථානවලට ළඟා විය හැකි ආකාරයට පැරණි මාර්ග නැවත පුනරුත්ථාපනය මඟින් වනය තුළ අතීත ස්මාරක ස්ථාන ගැන අමුත්තන්ට අවබෝධයක් දිය හැකි වේ. එසේ ම, දැනට වනයේ තැන තැන ඇති අඩි පාරවල් වසා දැමීමට ද කටයුතු කළ යුතු වේ.

### 5.5 සංචාරකයන් සඳහා පොදු පහසුකම් වැඩි දියුණු කිරීම

සංචාරකයන් සඳහා නල ජල පහසුකම් සහිත පොදු වැසිකිළි පහසුකම් සලසා දීම වැදගත් වේ. දැනට

උද්‍යානයේ ජලාශය අසල සංචාරකයන්ට ආහාර ගැනීමට හා ගිමන් හැරීමට එක් ස්ථානයක් පමණක් ඇතත් තව එවැනි එක් ස්ථානයක් හෝ සැලසුම් කිරීම යහපත් වේ. ජනයා ඇවිද යන ප්‍රධාන මාර්ග දෙපස දැනට තිබෙන සිමෙන්ති බංකුවලට අමතරව තව කිහිපයක් සවි කිරීම වැදගත් වේ. එසේම වනය තුළ අපද්‍රව්‍ය දැමීම සඳහා දැනට කිසිම භාජනයක් දැකිය නොහැකි අතර එවැනි භාජන තැබිය යුතු වේ. ඒවා රිලවුන් හා වෙනත් සතුන්ට ඇද දැමිය නොහැකි ලෙස සැලසුම් කිරීම ඉතා වැදගත් වන අතර ඒවායේ රැස්වන අපද්‍රව්‍ය එකතු කර විනාශ කර දැමීමටත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වේ.

දැනට සිංහල මාධ්‍යයෙන් මුද්‍රිත විස්තර පත්‍රිකාවක් උඩවත්ත කැලය පිළිබඳ දක්නට ලැබේ. විශේෂයෙන් විදේශික සංචාරකයින් විශාල ප්‍රමාණයක් ගෙන්වා ගත හැකි උද්‍යානයක් වන හේතුවෙන් හොඳින් තොරතුරු ඇතුළත්ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් විස්තර පත්‍රිකාවක් සැකසීම ඉතා වැදගත් වේ.

## මග පෙන්වීමේ සේවයක් ආරම්භ කිරීම

වන උද්‍යානය තුළ සේවය කරන අධ්‍යාපන හා ව්‍යාප්ති නිලධාරීන්ගේ සේවයට අමතරව පරිසර පිළිබඳ දැනුමක් ඇති මග පෙන්වීමේ සේවයක් ආරම්භ කළ හැකිය. මේ සඳහා විවිධ පාරිසරික සංගම්වල සාමාජිකයින් යොදාගත හැකි වේ. එසේ තෝරා ගන්නා අයට ඒ පිළිබඳ කෙටි පුහුණුවකින් පසු ස්වේච්ඡා පදනමක් මත කටයුතු කිරීමට සැලැස්විය හැකිය. මෙවැනි අයගේ සේවය ලබා ගන්නා අය විසින් එම අයට ගෙවිය යුතු ගාස්තුවක් නියම කළ යුතු වේ. මෙවැනි මග පෙන්වන්නන් සිංහරාජ වනය හා මුතුරාජවෙල ආශ්‍රිතව යොදා ගනු දක්නට ලැබේ.

## වන උද්‍යානය පිළිබඳ ප්‍රචාරක වැඩසටහන්

උඩවත්ත කැලය වන උද්‍යානයේ ඇති විද්‍යාත්මක වටිනාකම සහ සෞන්දර්යාත්මක වටිනාකම ගැන ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක වැඩ කටයුතු සිදු කළ යුතු වේ. මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය මේ සඳහා යොදා ගත හැකිය. මෙම වැඩසටහන මඟින් වන උද්‍යානය තුළ අමුත්තන් සඳහා සපයා ඇති පහසුකම් සහ සේවා ගැන මහජනයා දැනුවත් කළ යුතු අතර එමඟින් වන උද්‍යානයට එන නරඹන්නන්ගේ ප්‍රමාණය වැඩිකර ගත හැකි වේ.

විදේශීය සංචාරකයන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා මහනුවර නගරය පිළිබඳව සංචාරක මණ්ඩලය මඟින් නිකුත් කර ඇති විස්තර පත්‍රිකා සහ අත් පොත්වලට උඩවත්ත වන උද්‍යානය පිළිබඳ විස්තර ඇතුළත් කිරීමට ආයතනික මට්ටමින් කටයුතු කළ යුතු වේ. එසේ ම, මහනුවර හා අවට පිහිටා ඇති සංචාරක හෝටල් භාවිතා කරමින් උඩවත්ත කැලය පිළිබඳ විස්තර එම හෝටල්වල ප්‍රදර්ශනය කිරීම සහ හෝටල් හිමියන් මාර්ගයෙන් වන උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා සමූහ ගමන් පහසුකම් සැලසීම වැනි වැඩ සටහන් ආරම්භ කළ හැකිය. මෙවැනි දේ මඟින් විදේශීය සංචාරකයින්ගේ පැමිණීම වැඩි කළ හැකි වේ.

නාගරික වනයක් ලෙස උඩවත්ත කැලයේ වැදගත්කම, එහි පර්යේෂණ සඳහා ඇති අවකාශ සහ විවිධ පර්යේෂණ අංශයන්, ඓතිහාසික සහ සංස්කෘතික වටිනාකම ද ඇතුළත් "වෙබ් අඩවියක්" ආරම්භ කිරීමත් නූතන තාක්ෂණික ක්‍රමවලට අනුව ප්‍රතිඵල ගෙන දිය හැකි තවත් ආකාරයකි.

දැනට උඩවත්ත කැලය තුළ සංරක්ෂණ මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇති අතර එමඟින් මහගු ඵල ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

## අදහස්

මහනුවර නගරයේ පරිසර දූෂණය පාලනය කිරීමට විශාල මෙහෙයක් කරන මෙම වන උද්‍යානය ජල විද්‍යාත්මකව ද, ඉතා වැදගත් ස්ථානයකි. ඊට හේතුව නම්, මහවැලි ගඟට සහ නුවර වැවට ජලය මුදා හරින ජලාධාර ප්‍රදේශයක් ලෙස උඩවත්ත කැලේ වන උද්‍යානය ක්‍රියා කිරීමයි.

එසේම, මෙම වනය තුළ දී දැකිය හැකි, ශ්‍රී ලංකාවට ආවේණික ශාක ප්‍රභේද සහ සත්ත්ව විශේෂ නිසා මෙහි ඇති ජෛව විද්‍යාත්මක වැදගත්කම ද ඉතා ඉහළ මට්ටමක පවතී.

තව ද, පරිසර සංචාරක ව්‍යාපාරයට සහ විනෝද මධ්‍යස්ථානයක් වශයෙන් ද, මෙම උද්‍යානයෙන් ගත හැකි ප්‍රයෝජන බොහෝය.

උද්‍යානය නැරඹීමට එන ජනයාගෙන් ලැබෙන ආදායම මෙම වන උද්‍යානයට ම ප්‍රයෝජනයට ගැනීමට හැකිවන ලෙස ක්‍රමයක් සකස් කිරීමට හැකි නම්

එය වන උද්‍යානයේ නඩත්තුව සඳහා ඉතා වැදගත් වේ.

එසේම, මෙම උද්‍යානය තුළ විවිධ පර්යේෂණ කටයුතු කිරීමට විද්වතුන් උනන්දු කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් වන උද්‍යානය තුළ සැපයිය යුතුය.

උඩවත්ත කැලයේ වෙසෙන රිලවුන් ප්‍රමාණය වැඩි වීම, වන උද්‍යානය අවට වෙසෙන මහජනයාට ඉතා කරදරකාරී වාතාවරණයක් ඇති කර තිබේ. එමනිසා, මෙම රිලා රංචු උද්‍යානයට සීමා කිරීම සඳහා කළ යුත්තේ කුමක් ද යන්න අධ්‍යයනය කළ යුතු වේ. එසේම, රිලවුන් වන උද්‍යානයෙන් පිටතට පැමිණීමට ඉඩ නොතබා ඔවුනට ආහාරයට ගතහැකි අපද්‍රව්‍ය සහ කසල තැන තැන නොදමා ක්‍රමානුකූලව කසල බැහැර කිරීමට අවට සිටින ජනයා දැනුවත් කළ යුතු වේ.

මෙසේ රිලවුන් වන උද්‍යාන තුළ වැඩි වීම, වනයේ කුරුල්ලන් ප්‍රමාණය අඩු වීමට හේතුවක් වී ඇතැයි ද මතයක් පළ වී තිබේ. රිලවුන් විසින් කුරුළු කූඩු විනාශ කර දැමීම නිසා මෙය සිදුවන බවට විශ්වාස කරයි. එම නිසා, මෙම රිලා ගහනය පරිසරයට දරා සිටිය හැකි ප්‍රමාණයකට පාලනය කිරීම සඳහා කටයුතු කළ යුතු වේ.

වන උද්‍යානයේ මායිම් වැටවල් ශක්තිමත් කර පිටස්තර අයට අනවසරයෙන් උද්‍යානය තුළට ඇතුළු වීමට නොහැකි වන ලෙස කටයුතු කළ යුතු වේ. මේ මඟින් වන උද්‍යානයේ තිබෙන වන සත්ත්ව සහ ශාක ජීවිතයේ ආරක්ෂාව තහවුරු කළ හැකිය. එසේ ම, මෙලෙස පිටස්තර පුද්ගලයින් උද්‍යානයට අනවසරයෙන් ඇතුළුවීම නරඹන්නන්ගේ ආරක්ෂාවට ද බාධාවක් ලෙස සැලකිය හැකිය.

මහනුවර නගර මාධ්‍යයේ පිහිටා තිබෙන මෙම වනය, මහනුවර ජීවත්වන අපගේ පමණක් නොව ලොව සියළු දෙනාගේ ම ප්‍රයෝජනයට ගත හැකි ලෙස සුරැකීම සොබාදහමට ඇලුම් කරන කාගේත් යුතුකම වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි


* සිළුමිණ රසඳුන - 2008, 1998 රජ දවසේ හැමූ මල් සුවඳ
* Sunday Observer- 11.01.1998, Taking a stroll in Udawattakalle
* S.A.S.K. Senadheera (1997) Classification and analysis of vegetation in the Udawattakalle' forest resource by final year project report
* The Air Lanka Forester, Vol xl Nos 3 & 4 Jan-Dec 1974
* Karunarathne, N. (1986) Udawattakalle the trobidden forest of the Kings of Kandy, Dept of Government Printing, Colombo.
* G.M Henry, A guide to the Birds of Sri Lanka.



**එච්.එම්.ජේ.කේ. හේරත්**

*පර්යේෂණ නිලධාරී*

**අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



**කංචුකය**

**අදහස**

සී.යූ. සේනානායක

**නිර්මාණය කිරීම**

ජේ.පී.යූ. කරුණාරත්න

**ඡායාරූපය**

හංස යසරත්න

**සේයාරුව**

බණ්ඩක්කා පුෂ්පය


*වෙනස.........................*

**පිණි බිඳු**
**බිම සිඹියි.....**
**හරියටම නුඹේ දෙකොපුළ**
**සිපගත් කඳුලු බිඳ හා සමයි**
**හැබැයි,**
**මේ පිණි බිංදු මහ පොළොව**
**තෙත් කරයි.....**
**නුඹ කඳුල පිසදා හිනැහෙන්න**
**වෙර දරයි**
**පොළොව එසඳ**
**නුඹ සමඟ සිනාසෙයි**

- *සී.යූ* -